# පරිසර පද්ධතිවල සෞඛ්‍යය

පරිසර පද්ධතියක් යනු පරිසරයේ පවත්නා ජීවී සහ අජීවී සංඝටක එක් වී සෑදුන ස්වායත්ත ක්‍රියාකාරී ඒකකයකි. පෘතුවිය මත විවිධ පරිසර පද්ධති දැක ගත හැකි අතර මෙම පරිසර පද්ධති ජෛව විවිධත්යෙහි සංකීර්ණම මට්ටම ලෙස සැලකේ. එබැවින් පරිසර පද්ධති නිසි අයුරින් සංරක්ෂණය සහ කළමනාකරණය කිරීම ජෛව විවිධත්වයෙහි අනෙක් ප්‍රධාන සංඝටක දෙක වන ජාන විවිධත්වය සහ විශේෂ විවිධත්වය සංරක්ෂණය කිරීමට ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාව වර්ග කි.මී. 65610 න් සමන්විත වූ කුඩා දිවයිනක් වුවද ලෝකයේ ජෛව විවිධත්වය ඉහළම ස්ථාන (Biodiversity Hotspots) විසි පහෙන් එකක් ලෙස හඳුනා ගෙන ඇත. මෙවන් ඉහළ ජෛව විවිධත්වයකට ශ්‍රී ලංකාව හිමිකම් කීම සඳහා මුල් වූ එක් සාධකයක් ලෙස ශ්‍රී ලංකාවේ පවතින පරිසර පද්ධති විවිධත්වය සඳහන් කල හැකිය.

ශ්‍රී ලංකාවේ දක්නට හැකි පරිසර පද්ධති ස්වාභාවික සහ මිනිසා විසින් නිර්මාණය කරන ලද පරිසර පද්ධති වශයෙන් ප්‍රධාන කාණ්ඩ දෙකකට බෙදා දැක්විය හැකිය. මෙම එක් එක් කාණ්ඩය තව දුරටත් භෞමික සහ ජලජ පරිසර පද්ධති ලෙස වර්ගීකරණය කල හැකිය.

ශ්‍රී ලංකාවේ දැකගත හැකි ප්‍රධාන ස්වාභාවික භෞමික පරිසර පද්ධති ලෙස වනාන්තර, තෘණ භූමි, වෙරළබඩ වෘක්ෂලතා සහ වැලිවැටි හඳුන්වා දිය හැකිය. පිහිටා ඇති දේශගුණික කලාපය මත ස්වාභාවික වනාන්තර තව දුරටත් වර්ගීකරණය කල හැකිය. එනම් පහත රට තෙත් කලාපයේ පිහිටි සදාහරිත තෙත් නිවර්තන වැසි වනාන්තර, තෙත් කලාපයේ කඳුකරය ආශ්‍රිතව දැකගත හැකි නිවර්තන පහත කඳුරට වනාන්තර, නිවර්තන උස් කඳුකර වනාන්තර, වියලි කලාපයේ පිහිටා ඇති වියලි මිශ්‍ර සදාහරිත වනාන්තර, ශුෂ්ක කලාපයේ පිහිටා ඇති කටු ලැහැබ් සහ අතරමැදි කලාපයේ පිහිටා ඇති පහත රට, මැදි රට සහ කඳුරට වනාන්තරය, මීට අමතරව ප්‍රධාන ගංගා ආශ්‍රිතව ඇති ගංගාශ්‍රිත වනාන්තරද නම් කල හැකිය.

එමෙන්ම තෘණභූමි පරිසර පද්ධතියද කඳුකරය ආශ්‍රිතව පිහිටා ඇති තෙත් පතන, තෙත් කලාපයේ පිහිටා ඇති තලාව තෘණ භූමි,වියලි කලාපයේ පිහිටා ඇති දමන සැවානා සහ විල්ලු තෘණභූමි වශයෙන් තව දුරටත් බෙදා දැක්විය හැකිය. මීට අමතරව මිනිසා විසින් නිර්මාණය කරන ලද භෞමික පරිසර පද්ධති වශයෙන් වන වගාවන්, මහා පරිමාණ වැවිලි සහ ගෙවතු , මල්වතු වැනි පරිසර පද්ධතීන් දැක ගත හැකිය.

ශ්‍රී ලංකාවේ පිහිටි ස්වාභාවික ජලජ පරිසර වශයෙන් ගංගා, ඇළ දොළ, වැනි ප්‍රධාන පරිසර පද්ධතීන්ද, මිරිදිය වගුරු, කඩොලාන, විල්ලු, කොරල්පර, ලවන වගුරු, මුහුදු තෘණ භූමි වැනි වෙරළාසන්න පරිසර පද්ධතීන් නම්කල හැකිය. එමෙන්ම වැව්, ජලාශ, පොකුණු, කුඹුරු සහ වාරිමාර්ග ඇළවල් වැනි මිනිසා විසින් නිර්මාණය කරන ලද ජලජ පරිසර පද්ධති ගණනාවක්ද ශ්‍රී ලංකාව තුළ දැකගත හැකිය.

මේ අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාව පරිසර පද්ධති රාශියකට හිමිකම් කියන බවයි. තවද කෙටි කාලයක් තුළ පරිසර පද්ධතීන් ගණනාවක් දැකගත හැකි වීම ශ්‍රී ලංකාව සතු තවත් සුවිශේෂ ලක්ෂණයකි.

සියලුම පරිසර පද්ධතීන් විටින් විට ස්වාභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කරන ලද උවදුරු වලට ලක් වේ. ස්වභාවික උවදුරු සඳහා නිදසුන් වශයෙන් ලැව් ගිනි, ඉඩෝරය, ජල ගැලීම් වැනි ස්වාභාවික ක්‍රියාවලීන් හඳුන්වා දිය හැකිය. මිනිසා විසින් නිර්මාණය කරන ලද උවදුරු ලෙසට පරිසර පද්ධති සංවර්ධන ක්‍රියාවලි උදෙසා විශාල වශයෙන් වෙනස් කිරීම, පරිසර පද්ධති කැබලිකරණය කිරීම, විවිධ දූෂක ද්‍රව්‍යයන් පරිසරයට මුදා හැරීම, අධි පරිහරණය හා ඒ ආශ්‍රිතව සිදුවන පරිසර හානි වැනි ක්‍රියාවලීයන් හුවා දැක්විය හැකිය.

මෙවන් උවදුරු වලට ලක්වීම තුළ පරිසර පද්ධතිවල ඒකාග්‍රතාවය නිරන්තරයෙන් අභියෝගයට ලක් වේ. බොහෝ පරිසර පද්ධති වලට මෙවන් උවදුරු වලට සාර්ථකව මුහුණ දී නැවතත් යතාතත්වයට පත්වීමට හැකියාව ඇත. නමුත් මෙවන් උවදුරක් හේතු කොටගෙන පරිසර පද්ධතිය සතු මූලික ගුණාංගයක් විනාශයට පත් වුවහොත් හෝ දිගින් දිගටම මෙවන් ආතතීන් වලට පරිසර පද්ධති ලක් වුවහොත් පරිසර පද්ධතිය විශාල වශයෙන් පිරිහීමකට හෝ මුලුමනින්ම විනාශයට ලක්වීමටද ඉඩ ඇත. එබැවින් කෘත්‍යමය සහ ව්‍යුහමය ඒකාග්‍රතාවය රැක ගැනීම පරිසර පද්ධතියක දිගු කාලීන පැවත්ම සාක්ෂාත් කිරීම සඳහා අත්‍යාවශ්‍ය කාරණයක් වන්නේය. නිදසුනක් වශයෙන් යම් කිසි පුද්ගලයෙකුට හෘදයාබාධයක් වැළදෙන්නේ එම පුද්ගලයා විවිධ ආතතීන්ට ලක් වීම තුලය. මෙම ආතතින් දිගින් දිගටම පැවතුනහොත් එම පුද්ගලයාගේ සෞඛ්‍ය තත්වය පිරිහීමට ලක් වී අවසන් වශයෙන් මරණය ගෙන දේ. එමෙන්ම පරිසර පද්ධතියක්ද දිගින් දිගටම දැඩි ආතතියකට ලක් වීම තුළ පරිසර පද්ධතයෙහි සෞඛ්‍ය තත්ත්වය පිරිහීමකට ලක් වී විනාශයට පත් විය හැකිය. එබැවින් යම් පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමනාකරණය කිරීමේදී යොදාගන්නා මූලික උපක්‍රමයක් නම් පරිසර පද්ධතිවල සෞඛ්‍ය තත්වය මැනවින් විමර්ශණය කර පරිසර පද්ධති කෙරෙහි බලපාන ආතතින් හඳුනාගෙන එම ආතතින් අවම කර ගැනීම සඳහා සුදුසු ක්‍රියා මාර්ගයන් ක්‍රියාත්මක කිරීමය.

මෙහිදී පරිසර පද්ධති වල සෞඛ්‍ය තත්වය විමර්ශණය කිරීම සඳහා යම්කිසි පදනමක් අවශ්‍ය වේ. මේ සඳහා විවිධ දර්ශකයන් යොදාගත හැකිය. පරිසර පද්ධතියක සෞඛ්‍ය තත්ත්වය මැනගැනීම සඳහා යොදාගත හැකි දර්ශකයන් සමහරක් නම්,

## 1. ව්‍යාප්තිය

යම් කිසි පරිසර පද්ධතියක ව්‍යාප්තිය එම පරිසර පද්ධතියෙහි සුලභතාවය මැන ගැනීම සඳහා පහසුවෙන් යොදාගත හැකි දර්ශකයකි. එමෙන්ම කාලයත් සමඟ යම් කිසි පරිසර පද්ධතියක ව්‍යාප්තිය වෙනස් වන ආකාරය එම පරිසර පද්ධතියෙහි පැවැත්ම පිළිබඳව අදහසක් ලබා ගැනීමට ඉවහල් වන දර්ශකයකි. උදාහරණයක් වශයෙන් ශ්‍රී ලංකාවේ වන වැස්ම ගත හැක. යම්කිසි රටක ස්භාවික වන වැස්ම එම රටෙහි ස්වාභාවික පරිසර පද්ධති පිලිබඳව හොඳ දර්ශකයකි. ශ්‍රී ලංකාවේ වර්තමාන වන වැස්ම දළ වශයෙන් භූමි ප්‍රදේශයෙන් 24% පමණ වේ. මෙය සංසන්දනාත්මකව ගත් කල සෑහිමකට පත් විය හැකි අගයකි. නමුත් මෙම වන වැස්මෙන් 95% පමණ සමන්විත වන්නේ වියලි කලාපයේය. ජෛව විවිධත්වය ඉතා ඉහල තෙත් කලාපයේ වන වැස්ම 4%ක් පමණ වන අතර මෙයින් පෙනී යන්නේ තෙත් කලාපීය වනනාන්තර පරිසර පද්ධතිය ඉතා වැදගත් වුවද එහි සෞඛ්‍ය තත්වය පිරිහීමට ලක් වී ඇති බවය. තවද කාලයත් සමග ශ්‍රී ලංකාවේ වන වැස්ම වෙනස් වන ආකාරය දෙස බලන කල පෙනී යන්නේ වසර 1881 ශ්‍රී ලංකාවේ වන වැස්ම 84% පමණ වන අතර එය ක්‍රම ක්‍රමයෙන් 24% දක්වා පහත වැටී ඇති බවයි. එබැවින් වන වැස්ම විචලතාවය යන දර්ශකය සලකා බලන කල ශ්‍රී ලංකාවේ වනාන්තර පරිසර පද්ධතිවල සෞඛ්‍ය තත්වය විශාල පිරිහීමක් ඇති වී තිබෙන බව පෙනී යයි.

## 2. භූමි කළමනාකරණය

භූමිය කළමනාකරණය කරන ආකාරයද පරිසර පද්ධතිවල සෞඛ්‍ය තත්වය පිළිබඳව දර්ශකයක් ලෙස යොදාගත හැක. භූමි කළමනාකරණ ප්‍රතිපත්තිය පරිසර පද්ධතිවල පිරිහීමට ලක්වන ආකාරයේ එකක් වේ නම් එයින් අපහට නිගමනය කල හැක්කේ නැවතත් පරිසර පද්ධතින්ගේ සෞඛ්‍ය තත්වය පහත වැටෙන බවයි. උදාහරණයක් වශයෙන් ශ්‍රී ලංකාවේ භූමි කළමනාකරණය පිළිබඳව නිසි ජාතික ප්‍රතිපත්තියක් නොමැත. එබැවින් භූමි කළමනාකරණය තුල විශාල පරිසර ප්‍රශ්න රාශියක් පැන නැගී ඇත. කඩොලාන පරිසර පද්ධති ගණනාවක් ඉස්සන් වගාව හේතු කොට ගෙන විනාශයට ලක් වී ඇත. තෙත් බිම් ගොඩ කිරීම තුල ජෛව විවිධත්වයෙන් ඉතා පොහොසත් වූ මෙම පරිසර පද්ධතිය සීඝ්‍රයෙන් පරිහානියට ලක් වී ඇත. සැලසුමකින් තොරව සිදුවන සංවර්ධන ක්‍රියාවලින් සහ ජනාවාස බිහි කිරීම තුල පරිසර පද්ධති පමණක් නොව ඒවා සංවර්ධන ව්‍යාපෘති ඉලක්ක කර ගත් ජන කොට්ඨාශද මහත් පරිහානියකට ලක් වී ඇත. ඒ කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 14%ක ප්‍රදේශයක් සංරක්ෂණය සඳහා වෙන් කොට ඇත. මෙය ඉතා පැසසුම් දායක තත්වයක් වුවද මෙම බොහෝ රක්ෂණයන් පිහිටා ඇත්තේ අතර මැද හෝ වියලි කලාපයේය. ජෛව විවිධත්වය සඳහා වඩාත් වැදගත් වූ තෙත් කලාපයේ රක්ෂිතයන් ඇත්තේ අතලොස්සක පමණි. එබැවින් රක්ෂිතයන් පිළිබඳව අප හට සම්පූර්ණයෙන්ම සෑහීමකට පත්විය නොහැකිය.



**වනපෙත් අභිමිච**
**ඡායාරූපය : ශ්‍රීලාල් නිශාන්ත හෙට්ටිආරච්චි**

## 3. තර්ජනයට ලක් වූ ජීවීන්

යම්කිසි රටක වෙසෙන තර්ජනයට ලක් වූ ජීවී විශේෂ ගණන සහ කාලයත් සමග එම විශේෂවල විචල්‍යතාවයද පරිසර පද්ධතිවල සෞඛ්‍ය පිළිබඳව දර්ශකයක් ලෙස භාවිත කල හැක. මීට හේතුව පරිසර පද්ධතිවල සෞඛ්‍ය තත්වය දිගින් දිගටම පිරිහීමකට ලක් වුවහොත් එම පරිසර වල ජීවත් වන ජීවී විශේෂද තර්ජනයට ලක් වන බැවිනි.

එම නිසා තර්ජනයට ලක් වූ ජීවී විශේෂ ගණන වැඩි වේ නම් හෝ කාලයත් සමග තර්ජනයට ලක් වූ ජීවී විශේෂ ගණන වැඩි වේ නම් එයින් හැඟී යන්නේ පරිසර පද්ධතිවල සෞඛ්‍ය තත්ත්වය පහත වැටී ඇති බවයි.

## 4. වාසස්ථාන වල ගුණාත්මක භාවය

පරිසර පද්ධතියක් පිරිහීමට ලක් වීමට එක් හේතුවක් නම් එහි ඇති භෞතික හා රසායනික ලක්ෂණයන් වෙනස් වීම සහ ඊට සමගාමීව සිදුවන ජීවී ලක්ෂණ වල වෙනස් වීමය. පරිසර පද්ධතියක භෞතික සහ රසායනික ලක්ෂණ විවිධ හේතූන් නිසා වෙනස් විය හැකිය. නිදසුනක් වශයෙන් ගලායන දොළක් සැලකූ විට එහි භෞතික ලක්ෂණ වශයෙන් දොලෙහි ගලන ජල ප්‍රමාණය, ජලය ගලන වේගය, වසර පුරාම ජලය ගැලීම සිදුවනවාද වැනි දේ වන අතර එහි ඇති රසායනික ලක්ෂණ වශයෙන් ජලයේ ද්‍රව්‍ය වායු සහ වෙනත් රසායනික අනු වර්ග සඳහන් කල හැකිය. කාලයත් සමග මෙම ලක්ෂණ වල යම් යම් වෙනස් වීම් සිදුවන අතර එම වෙනස් වීම් සමහර විට පරිසර පද්ධතියේ බිඳ වැටීම පවා ගෙන දෙයි. එබැවින් පරිසර පද්ධතියක් සතු භෞතික සහ රසායනික ලක්ෂණ වල ඇති වන වෙනස් වීම දර්ශකයක් ලෙස යොදාගත හැකිය. මෙම වෙනස් වීම් ඍජුවම හෝ වක්‍රාකාරව දිනාගත හැක. බොහෝ විට පරිසර පද්ධතියක ඇති ගුණාත්මක භාවය මැන ගැනීමට එහි වාසය කරන සමහර ජීවී විශේෂ යොදාගනු ලැබේ. නිදසුනක් වශයෙන් ජලජ පරිසර පද්ධතියක නම් සමහර මත්ස්‍ය විශේෂ බෙල්ලන් විශේෂ ප්‍රවංග වර්ග වැනි ජීවීන්ද, භෞමික පරිසරයක නම් පසෙහි වෙසෙන ක්ෂුද්‍ර ජීවීන්, ලයිකා විශේෂ සමහර ශාක විශේෂ මේ සඳහා යොදාගත හැකිය. මෙහිදී මුලින්ම සිදුකල යුත්තේ පරිසර පද්ධතියේ සෞඛ්‍ය තත්වය අනුරූපව තෝරා ගන්නා ලද ජීවී විශේෂයේ වෙනස් වීම මුලින් හදාරා දෙන ලද අවස්ථාවකදී එම ජීවී විශේෂයේ තත්වය ඇගයීම තුලින් පරිසර පද්ධතියේ සෞඛ්‍ය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමය.

## 5. හඳුන්වා දෙන ලද ජීවී විශේෂ

හඳුන්වා දෙන ලද ජීවී විශේෂයක් නම් මිනිසා විසින් වෙනත් රටක සිට මෙරටට හඳුන්වා දෙන ලද ශාඛ හෝ සත්ව විශේෂයි. බොහෝ විට මෙම ජීවී විශේෂ නව තත්ව යටතේ ඉතා වේගයෙන් ව්‍යාප්ත වීම හේතු කොට ගෙන පරිසර පද්ධතියෙහි සමතුලිතතාවය බිඳ වැටීමේ අවධානමක් ඇති වේ. නිදසුනක් වශයෙන් පාතීනියම්, මන්නාවා, හංබෙල්ලා, ජපන් ජබර වැනි ජීවී විශේෂ නම් කල හැකිය. එබැවින් පරිසර පද්ධතියක් තුල හඳුන්වා දෙන ජීවී විශේෂ ගණන හඳුනාගැනීම තුල එම පරිසර පද්ධතියෙහි සෞඛ්‍ය තත්වය පිළිබඳව ඇගයීමක් සිදුකල හැකිය.

## 6. ආවේණික විශේෂ

ආවේණික විශේෂයක් යනු යම් භූගෝලීය ප්‍රදේශයකට පමණක් සීමා වූ ජීවී විශේෂයකි. අප හඳුන්වා දෙන භූගෝලිය ප්‍රදේශය එම රටෙහි දේශ සීමාව නම් එම ජීවී විශේෂය එක දේශීය ජීවී විශේෂයක් ලෙස හඳුන්වා දෙනු ලැබේ. මෙවන් ජීවී විශේෂ බොහෝවිට වාසස්ථානවලට විශේෂණය වී ඇති අතර වාසස්ථානවල ගුණාංග වෙනස් වුවහොත් එම වාසස්ථානවලින් ඉවත් වීම හෝ වඳවී යාම සිදුවේ. නිදසුනක් වශයෙන් රතුවත මල්කොහා යන ආවේණික පක්ෂි විශේෂය ගංගාශ්‍රිත වනාන්තර වලට සීමාවී ඇත. ලංකාවට ආවේණික මත්ස්‍ය විශේෂ බොහොමයක් තෙත් කලාපයේ වනාන්තර ආශ්‍රිත දොළ වල් වලට සීමා වී ඇත. පරිසර පද්ධතියක් පිරිහීමට ලක්වන විට බොහෝ විට මුලින්ම ඉවත්ව යන්නේ ආවේණික ජීවීන් බැවින් යම් පරිසර පද්ධතියක වෙසෙන ආවේණික ජීවී විශේෂ ගණන එම පරිසර පද්ධතියෙහි සෞඛ්‍ය තත්ත්වය පළිබඳව දර්ශකයක් ලෙස යොදාගත හැකිය.

## 7. පළිබෝධක විශේෂ

යම් ස්වභාවික පරිසර පද්ධතියක් පිරිහීමකට ලක්වන විට එම පරිසර පද්ධතිය අවට ඇති මිනිසා විසින් නිර්මාණය කරන ලද පරිසර පද්ධතිවල වෙසෙන ජීවී විශේෂ ආක්‍රමණය කිරීමට පෙළඹෙයි. මොවුන් ඇතිකරන තරගය තුල ස්වාභාවික පරිසර පද්ධතියේ වෙසෙන ජීවී විශේෂ දැඩි ආතතියකට පත්වේ. සමහර ජීවී විශේෂ වඳවී යාමට පවා ඉඩ ප්‍රස්ථාව ඇත. මේ ලෙස ස්වාභාවික පරිසරයක් ආක්‍රමණය කරන ජීවී විශේෂ පළිබෝධක විශේෂ ලෙස හඳුන්වා දේ. එබැවින් පරිසර පද්ධතියක වෙසෙන පළිබෝධක විශේෂ ගණන එම පද්ධතියෙහි සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ දර්ශකයක් ලෙස යොදා ගත හැකිය.

## 8. වනාන්තර වල වියන් වැස්ම

වනාන්තරයක වියන් වැස්ම නිර්ණය වන්නේ එහි ඇති ශාඛ වල ඝනත්වය මතය ශාඛ ගණන අඩුවන විට වියන් වැස්මද අඩුවේ. වියන් ස්ථරයේ ජීවී විශේෂ ගණනක් ජීවත් වන ස්ථානයකි. එබැවින් වියන් වැස්ම අඩුවන විට ඒ හා සමගාමීව ජීවී විශේෂ වල ද විවිධත්‍යතාවය ඇතිවේ. තවද වියන් වැස්ම අඩුවන විට වැසි ජලය කෙලින්ම බිම පතිත වීම හේතුකොට ගෙන පාංශු ඛාදනයද වැඩි වේ. එබැවින් වනාන්තරයක සෞඛ්‍ය තත්ත්වය පළිබඳව දර්ශකයක් ලෙස එහි වියන් වැස්ම යොදාගත හැකිය.

## 9. කෘෂිකාර්මික පද්ධතිවල සෞඛ්‍ය තත්වය

කෘෂිකාර්මික පරිසර පද්ධති මිනිසා විසින් නිර්මාණය කරන ලද පද්ධතියක් වුවද විශාල ජෛව විවිධත්වයකට හිමිකම් කියයි. එබැවින් එම පද්ධති ඒ අයුරින් පවත්වා ගෙන යාම ඉතා වැදගත්ය. එවන් පද්ධතියක් වෙනත් භූමි පරිහරණ රටාවකට වෙනස් කලහොත් එහි සෞඛ්‍ය තත්ත්වය පිරිහීමකට ලක්වේ. නිදසුනක් වශයෙන් කුඹුරක් ගොඩකර ගොඩනැගිල්ලක් ඉදිකිරීම, රබර් වත්තක් කැබලි කොට ජනාවාසයක් ඉදිකිරීම වැනි දේ තුල එම පද්ධතිය භූමි පරිහරණ රටාවන් සඳහා වෙනස් කරන්නේද යන්න එවන් පරිසර පද්ධතිවල සෞඛ්‍ය තත්වය මැනගැනීමට ඉවහල් වේ.



**මහ වනයක සුන්දරත්වය**
**ඡායාරූපය : අරුණ ශාන්ත අතුකෝරල**

## 10. නාගරික පරිසර පද්ධතිවල සෞඛ්‍ය තත්ත්වය

නාගරික පරිසර පද්ධතියකද ජීවීන් විශේෂ ගණනාවක් දැකගත හැකිය. එම පරිසර පද්ධතියේ සෞඛ්‍ය පවත්වා ගැනීමට එම ජීවී විශේෂ උපකාරී වේ. නාගරික පරිසර පද්ධතියක ඇති ශාඛ ආවරණය එසේත් නැතිනම් ජීවී විවිධත්වය වැනි දේ එහි සෞඛ්‍ය තත්වය පිළිබඳව දර්ශකයක් ලෙස යොදා ගත හැකිය.

මේ ආකාරයට බලන විට පරිසර පද්ධතියක සෞඛ්‍ය තත්වය යනු එම පරිසර පද්ධතිය පවත්වා ගෙන යාම සඳහා තිබිය යුතු භෞතික, රසායනික හා ජීවී ලක්ෂණයක් ප්‍රශස්ථ මට්ටමක පවත්වාගෙන යාමය. විවිද ස්වාභාවික හා මිනිසා විසින් නිර්මාණය කරන ලද උවදුරු හේතු කොට ගෙන පරිසර පද්ධතියක එම ගුණාංග එකක් හෝ කිහිපයක් පිරිහීමකට ලක්වුවහොත් එහි සෞඛ්‍ය තත්ත්වයේ බිඳවැටීමක් සිදුවේ.

එබැවින් පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමනාකරණයේදි එහි සෞඛ්‍ය තත්වය පිළිබඳව මනා අවබෝධයක් තිබීම . අත්‍යාවශ්‍ය කරුණකි.මේ සඳහා අපට දෙන ලද පරිසර පද්ධතියක සෞඛ්‍ය තත්වය පිළිබිඹු කරන දර්ශකයක් යොදා ගත හැක. මේ සඳහා දර්ශකයන් රාශියක් තෝරාගත හැකි අතර තෝරා ගන්නා දර්ශකයන් පරිසර පද්ධතියෙන් පරිසර පද්ධතියට වෙනස් වේ. මෙම ලිපිය තුලින් මා උත්සාහ කරන්නේ පරිසර පද්ධතියක සෞඛ්‍ය තත්වය මැන ගැනීම සඳහා ඇති ක්‍රම පිළිබඳව කෙටි විග්‍රහයක් කිරීමටය. මෙම පරිසර පද්ධතිවල සෞඛ්‍යය තත්වය ප්‍රශස්ථ මට්ටමක පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය දීර්ඝ කාලීනව සංරක්ෂණය කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.

**ආචාර්ය දේවක වීරකෝන්**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව**
**කොළඹ විශ්ව විද්‍යාලය**